**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සාධන පරීක්ෂණය - 2025

5 ශ්‍රේණිය

**ගණිතය**


නම/ විභාග අංකය: ........................................ කාලය පැය 1 යි මිනි.30

- පහත දී ඇති ප්‍රශ්න සඳහා සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. 39399 ට එකක් එකතු කළ විට ලැබෙන පිළිතුර තෝරන්න.

   i. 39499 ii. 39400 iii. 40400

2. මෙම කාඩ්පත් වලට අදාල සංඛ්‍යාව වන්නේ


   i. 4532
   ii. 2354
   iii. 4502

3. 4563 + 3223 + 117 = ........................

   i. 7913 ii. 7803 iii. 7903

4. පන්තියක තිබූ ගුරු මේසයක පළල 55cm වේ. එහි දිග පළල මෙන් දෙගුණයකි. ගුරු මේසයේ දිග සොයන්න.

   i. 105 cm ii. 1 m 10 cm iii. 110 m

5.  මෙම රූපයේ පාට නොකළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස දැක්වූ විට පිළිතුර වන්නේ,

   i. 0.4 ii. 0.6 iii. 6.0

6. ඔරලෝසු මුහුණතේ දැක්වෙන වේලාව අකුරින් ලියූ විට පිළිතුර වන්නේ,

   i. දහයට පහයි
   ii. දහයට දහයයි
   iii. නවය පසුවී මිනිත්තු දහයයි

7. පස්වරු 3.20 ට ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු ලිවීම ආරම්භ කළ කවීෂ පැය එකයි මිනිත්තු තිහකින් එය අවසන් කළේය. අවසන් කළ වේලාව පැය 24 ඔරලෝසුවෙන් දැක් වූ විට,

   i. 15:20 ii. 16:50 iii. 05:50

8. නුවන් රුපියල් 925.00 කට කමිසයක්ද රුපියල් 390.00 ඉන පටියක් ද ගෙන රුපියල් 1500.00 ක මුදලක් මුදලාලි මහතාට දුන් පසුව ඔහුට ලැබුණ ඉතිරි මුදල වන්නේ,

   i. රුපියල් 475.00 ii. රුපියල් 125.00 iii. රුපියල් 185.00

9. ගොවියෙක් තම ගෙවත්තේ තිබූ වට්ටක්කා ගෙඩියක් කඩා බර කිරා ගැනීම සඳහා තරාදියේ එක් පැත්තකට වට්ටක්කා ගෙඩිය දමා අනෙක් තැටියට 1kg පඩිය හා 200g පඩිය දැම්මේය. නැවත වට්ටක්කා ගෙඩිය ඇති තැටියට 50g පඩිය දැමූ විට බර සමාන විය. මේ අනුව වට්ටක්කා ගෙඩියේ බර වන්නේ,

i. 1kg 150g ii. 1kg 250g iii. 1kg 200g

10. සිරස් දාර හතරක් හා තිරස් දාර තුනක් ඇති ඝනවස්තු පිළිවෙළින් දැක් වූ විට පිළිතුර වන්නේ,

i. ඝනකය හා ඝනකාභය
ii. ඝනකය හා චතුස්තලය
iii. චතුස්තලය හා ඝනකය

11. බිත්තියක තිරස් බව හා සිරස් බව හඳුනා ගැනීමට භාවිතා කරන උපකරණ පිළිවෙළින් ඇතුළත් පිළිතුර වන්නේ,

i. ස්ප්‍රීතු ලෙවලය හා ලඹය
ii. ලඹය හා ස්ප්‍රීතු ලෙවලය
iii. මට්ටම් ලීය ලඹය

12. උදෑසන හිරු පායා එන දිශාවට මුහුණලා සිටගත් අයෙකුගේ දකුණත හා වම් අත පිහිටන දිශා වනුයේ,

i. දකුණු හා උතුරු දිශා
ii. බටහිර හා දකුණු දිශා
iii. උතුරු හා වයඹ දිශා

13. නදීකා ප.ව. 2.30 ට පමණ පාසල නිම වී ගෙදර එන අතරතුරදී ඇයගේ සෙවණැල්ල ඇය ඉදිරියෙන් ගමන් කළේ නම් ඇගේ වම් අත පිහිටි දිශාව වන්නේ,

i. උතුරු දිශාව
ii. නැගෙනහිර දිශාව
iii. දකුණු දිශාව

14. අරලියා ඉත්තක සෑම දිනකම පෙරදිනට වඩා මල් 3ක් වැඩිපුර පිපී තිබෙනු දක්නට ලැබේ. ඊයේ මල් 15ක් පිපී තිබුණි. අද පිපෙන මල් ගණන රෝම ඉලක්කමෙන් ලියූ විට පිළිතුර වන්නේ,

i. xv ii. xviii iii. xix

15. එක්තරා මැයි මාසයක දෙවෙනිදා බදාදා දවසකි. මෙම මාසයට ඇති සිකුරාදා දින ගණන වන්නේ,

i. 5 ii. 4 iii. 3




16. 2023 වර්ෂයේ ජනවාරි පළමුවන දා සඳුදා දවසකි. 2024 ජනවාරි පළමුවන දා කවදා දවසක්ද?

i. අඟහරුවාදා ii. බදාදා iii. බ්‍රහස්පතින්දා

17.ධාරිතාව $750ml$ වූ පැණිබීම බෝතල් 5ක ඇති පැණි බීම එක බෝතලයකට දැමුවේ නම් එහි ඇති පැණි බීම ප්‍රමාණය වන්නේ,

i. $3l\,750ml$ ii. $3l\,500ml$ iii. $3750l$

18.පහත හැඩතල අතරින් සමමිතික රේඛා 2ක් පමණක් ඇති හැඩතලය තෝරන්න.

i.  ii.  iii. 

19.එක් දිනකට පැය කටුව ඔරලෝසු මුහුණත වටා කර කැවෙන වාර ගණන වන්නේ,

i. 12 ii. 2 iii. 1

20.එක් අයෙකුට පැන්සල් 3 බැගින් පාසලක සිටින පිරිමි ළමයින් 245 දෙනෙකුට බෙදා දීමට අවශ්‍ය මුළු පැන්සල් ගණන සොයන්න.

i. 735 ii. 750 iii. 725

(ල. $2 \times 20 = 40$)

- **පහත ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.**

1. | 6 3 8 | කොටුව තුළ ඇති සියලුම ඉලක්කම් භාවිත කරමින් එකස්ථානය හා සියයස්ථානය යන ස්ථාන දෙකටම අට යෙදෙන ඉලක්කම් හතරේ සංඛ්‍යාවක් ලියන්න.

……………………………………………..

2. 33 479, 34 078 යන සංඛ්‍යා අතරින් විශාල සංඛ්‍යාව අකුරෙන් ලියන්න.

…………………………………………………….

3. කර්මාන්ත ශාලාවක මාස 3ක් තුළ නිපද වූ ඇඟලුම් සංඛ්‍යාව පහත දැක්වේ.

| **මාසය** | **මාර්තු** | **අප්‍රේල්** | **මැයි** |
|---|---|---|---|
| **කමිස** | 2275 | 3756 | 3580 |
| **ළමා ඇඳුම්** | 3479 | 2825 | 3913 |

i. මාස තුනේම නිපද වූ මුළු ළමා ඇඳුම් සංඛ්‍යාව සොයන්න.

…………………………………………………….

ii. අප්‍රේල් මාසයේ නිපද වූ කමිස ගණන ළමා ඇඳුම් ගණනට වඩා කොපමණ වැඩිද?

…………………………………………………….


iii. මාස තුනේම නිපද වූ කමිස හා ළමා ඇඳුම් අතර වෙනස කොපමණද?

…………………………………………………….

4. පහත සංඛ්‍යා රටා සම්පූර්ණ කරන්න.

   i. 2 , 8 , 14 , 20 , ……… , …………

   ii. ……… , ………… , 35 , 42 , 49

5.  මෙම රූපයේ අඳුරු කළ කොටස 4න් පංගුවක් ලෙස දක්වන්න.

6. මිනිසෙක් ගමනකින් $\frac{1}{4}$ ගිය විට 28km ගොස් තිබුණි. ගමන අවසන් කිරීමට ඔහු තව කොපමණ දුරක් යා යුතුද?

   ………………………………………………………

7. දුම්රිය මැදිරියක මගීන් 254කට ගමන් කළ හැකිය. එවැනි මැදිරි 5න් යුතු මැදිරියක ගමන් කළ හැකි මගීන් ගණන කොපමණද?

   ………………………………………………………

8. 287   4න් ගුණකළ විට පිළිතුර ලියන්න.

   ………………………………………………………

9.  ඔරලෝසු මුහුණතේ දැක්වෙන වේලාව ඉලක්කමෙන් ලියන්න.

   ……………………………

10. ටැංකියකට අල්ලන උපරිම ජලය ප්‍රමාණය ලීටර 100 කි. එහි දැනට $15l\ 750ml$ ජල පරිමාවක් ඇත. එය සම්පූර්ණයෙන් පිරවීමට තව කොපමණ ජල පරිමාවක් අවශ්‍යවේද?

    ………………………………………………………

11. තල කැරලි 728 එක් අයෙකුට 7 බැගින් බෙදා දීම සඳහා පැකට් කරන ලදී. එසේ තල කැරලි 7 බැගින් යෙදූ පෙට්ටි කොපමණ සංඛ්‍යාවක් බෙදා දිය හැකිද?

    ………………………………………………………

12. පාසලක සිසුන් 900ක් චාරිකාවක් යාම සඳහා බස්රථ හයක් යොදා ගන්නා ලදී. සෑම බස් රථයකම සමාන ගණනක් සිටියි නම් එක බස් රථයක ගමන් කරන පිරිස කොපමණද?


    ………………………………………………………

13. 10m දිග ලණුවකින් 5m 75cm කොටසෙක් කපා ඉවත් කළ විට ඉතිරි කොටසේ දිග සොයන්න.

    ………………………………………………………

(ලැ. 45)

- පහත දැක්වෙන මාර්ග විස්තරය අනුව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




1. මීගමුවේ සිට මහවැවට දුර සොයන්න.

   …………………………………………………….

2. කොළඹ සිට පුත්තලමට දුර කොපමණද?

   …………………………………………………….

3. වැඩිම දුරක් ඇත්තේ කුමන නගර දෙක අතරද?

   …………………………………………………….


4. මහ වැව සිට හලාවතට ඇති දුරට වඩා මංගල එළිය සිට පුත්තලමට ඇති දුර කොපමණ වැඩිද?

   …………………………………………………….

(ල. 10)

- සිසුන් කණ්ඩායමක් තමන් කැමති සතුන් පිළිබඳ දක්වන ලද තොරතුරු ඇතුළත් තීර ප්‍රස්තාරයක් පහත දැක්වේ.

   1. බල්ලාට කැමති සිසුන් ගණන කොපමණද?
   2. සමාන සිසුන් ගණනක් කැමති සතුන් නම් කරන්න.




(ල. 5)